# ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය

2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය
නිමිත්තෙන් පළ කරන ලද ශාස්ත්‍රීය සංග්‍රහය




සංස්කරණය

සිරිසමන් විජේතුංග
ආචාර්ය ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ



සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

# ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය

සංස්කරණය

සිරිසමන් විජේතුංග MSc

ආචාර්ය ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ PhD

සහාය සංස්කරණය

නන්දසේන පලිහක්කාර MA

සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

සෙත්සිරිපාය, බත්තරමුල්ල.

ශ්‍රී බු.ව. 2555

ක්‍රි.ව. 2011/2012

මේ ග්‍රන්ථයේ ඇතුළත් ලිපිවල අන්තර්ගත කරුණු පිළිබඳ වගකීම ඒ ඒ ලේඛකයන් සතු ය. ඔවුන් නියෝජනය කරන ආයතනවල හෝ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශයේ හෝ අදහස් එයින් පිළිබිඹු නොවන බව කරුණාවෙන් සලකන්න.

## ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතිය

ප්‍රථම මුද්‍රණය - 2012

© සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය

**ISBN 978-955-9117-25-4**

මුද්‍රණ සම්බන්ධීකරණය හා කළමණාකරණය
**චිත්‍රා දඹදෙණිආරච්චි**

පරිගණක පිටු සැකසුම
**අනුරාධ විජයවර්ධන බණ්ඩාර**
**සුනෙත් ලක්දුසිංහ**
**යුරේෂ් කාන්චන ගමගේ**

පිටකවරය
**අනුරාධ විජයවර්ධන**

ඡායාරූප
**මායා උපනන්ද**

ප්‍රකාශනය
**සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය**
සෙත්සිරිපාය, බත්තරමුල්ල.

මුද්‍රණය
**මධ්‍යම සංස්කෘතික අරමුදල**
කොළඹ 07.

# නමෝබුද්ධාය

## සංස්කාරක සටහන

මීට වසර 2600කට ඉහත දී සිද්ධාර්ථ තවුසාණෝ ගෞතම බුදුරජාණන් වහන්සේ ලෙසින් සම්මා සම්බුද්ධත්වයට පත් වූ සේක. එම සම්මා සම්බුදුරජාණන් වහන්සේගේ ජීවිතය සමස්තයක් ලෙසින් විමසුමට ලක් කරන ඇතැම් විද්වත්හු බුද්ධචරිතය ගැන මෙසේ අධ්‍යයනය කරති.

"බුදුරජාණන් වහන්සේගේ ජීවිතය අංශ දෙකකි. එනම්, පෞද්ගලික හා සමාජ ජීවිතය ලෙසිනි. සම්මා සම්බුදුරජාණන් වහන්සේ පිළිබඳ අපට ඉතා සමීප හුරුපුරුදු සංකල්පය වන්නේ භාවනාවෙහි යෙදුණු ප්‍රකෘති ලෝකය හැර දමා භාවනාමය ප්‍රීතියෙහි විසූ මුනිවරයකු ලෙස ය. අසෝක මහා අධිරාජයාගේ ධර්ම ප්‍රචාරක කටයුතුවල සේ ම ථේරවාදී බෞද්ධ චින්තනයෙහි ද සම්ප්‍රදායික සංකල්පය ද වූයේ ඉහත සඳහන් කරුණු ය. යථෝක්ත සම්ප්‍රදායය අනුගමනය කරන්නවුන්ට බුදුරජාණන් වහන්සේ යනු දෙවියෙකු නොව මිනිසෙකි. (ආශ්චර්යවත් මිනිසෙකි.) ගුරුවරයකු මිස ගැලවුම්කාරයෙක් ද නො වේ. බුදුරජාණන් වහන්සේගේ ජීවිතයෙහි අනෙක් අංශය වූයේ බුදුරජාණන් වහන්සේ ජනතාවගේ දුක්ඛ දෝමනස්නයන් හා බැඳුණු ගැටලුවලට සහනය සලසමින් බහුජන හිත සුව පිණිස කටයුතු කිරීම ය.

***( 2600 YEARS OF BUDDHISM- GENERAL EDITOR. Prof. P.V. BAPAT' (1956) P.VIII THE PUBLICATION DIVISION OF INFORMATION AND BROAD-CASTING. GOVT. OF INDIA ).***

බුදුසසුන භාරත දේශයෙන් පිට ව්‍යාප්ත කිරීම සඳහා අසෝක රජතුමා විසින් ඉටු කරන ලද මෙහෙය ද ෆාහියන් (ක්‍රි.ව.5) හියුංසාං (ක්‍රි.ව.7) යන චීන දේශාටන භික්ෂූන් වහන්සේ ද 19 වැනි සියවසේ ශ්‍රීමත් ඇලෙක්සැන්ඩර් කනිංහැම් වැනි පුරාවිද්‍යාඥයන් ද නිසා අද මේ පුදබිම් අපට දැක වැඳ පුදා ගැනීමට හැකි වී ඇත. බුද්ධගයාව බේරා ගත් අනගාරික ධර්මපාලතුමා නොවන්නට අද ඒ පුදබිම් බෞද්ධ ජනතාවට දැකීමට වත් නොලැබෙණු නිසැක ය.

දෙදහස් හයසියයේ ශ්‍රී සම්බුද්ධත්ව ජයන්ති වර්ෂය සමයේ දී අප රටට සම්බුදු දහම හඳුන්වා දුන් ඒ උතුම් අවස්ථාවද සිහිපත් කිරීම සැබවින් ම උචිත ය. මහින්දාගමනය අප රටේ එතෙක් පැවති ශිෂ්ටාචාරයේ හැරවුම් ලක්ෂයක් ලෙසින් සැලකිය යුතු වන්නේ කුමක් නිසා ද යන්න මහාචාර්ය වල්පොළ රාහුල හිමිපාණෝ මෙසේ සඳහන් කරති. "මහින්ද ස්ථවිරයන්ගේ ලංකාගමනය සිංහල සංස්කෘතියේ ආරම්භය හැටියට සැලකිය හැකි ය. උන්වහන්සේ ලංකාවට අලුත් ආගමක් පමණක් නොව එවකට කීර්තියෙන් අග තැන්පත් වූ මුළු සභ්‍යත්වය ම මෙරටට ගෙනා සේක. සංඝාරාමයන් සහ චෛත්‍යයන් කරවීමත් සමඟ ම උන්වහන්සේ මෙරට කලාව හා ගෘහනිර්මාණ ශිල්පය ද ඇබ්බැහි කළාහු ය. මිහිඳු හිමියන් සිංහල සාහිත්‍යයෙහි ආදි කර්තෘවරයාණන් හැටියට සිතිය හැකි ය. මහින්ද මහරහතන් වහන්සේ සිංහලද්වීපයට ත්‍රිපිටක අර්ථ කථා ගෙනැවිත් දීපවාසීන්ගේ යහපත සඳහා හෙළ බසට පෙරළූ බව බුද්ධඝෝෂ අටුවාචාර්යයෝ පවසති. උන්වහන්සේ මෙසේ සිංහල භාෂාව සාහිත්‍යමය භාෂාවක් කොට එහි හෝඩිය ද මෙරටට ඇබ්බැහි කරන්නට ඇතැයි සිතිය හැකි ය. මහින්ද ස්ථවිරයන්ගේ ධර්මදූත ව්‍යාපාරය එතරම් සාර්ථක වීමටත් බුද්ධ ධර්මය අපූර්ව වේගයකින් රට පුරා පැතිරීමටත් හේතු බොහෝ ය. මහින්දාගමනය වනාහි ඉන්දියාව හා ලංකාව අතර පැවති සාමාජික, සංස්කෘතික හා රාජ්‍ය සම්බන්ධතා රාශියක කුළුගැන්වීමකි.'' *(ලංකාවේ බුදු සමයෙහි ඉතිහාසය - මහාචාර්ය වල්පොළ හිමි (1972) පි.63)*

මිහිඳු මහ රහතන් වහන්සේ සිරිලකට වැඩම කරවීමට වසර තුන් හාරසියයකට පෙර දියුණු වාරි ශිෂ්ටාචාරයක් හා ඒ ආශ්‍රිත කෘෂිකාර්මික දියුණුවක් පැවති බවත් ඓතිහාසික වශයෙන් වංසකතාවල සඳහන් වී ඇත. මෙය පුරාවිද්‍යාත්මක ව ද ඔප්පු කිරීමේ පර්යේෂණ කැනීමක් අනුරාධපුර ගෙඩිගේ ආශ්‍රිත ව හිටපු පුරාවිද්‍යා අධ්‍යක්ෂ ජනරාල්

හා මෙකල පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ උපදේශක ආචාර්ය සිරාන් දැරණියගල මහතා විසින් 1980 ගණන්වල දී සිදු කරන ලදී. මෙහි දී ඉතා දියුණු මැටි බඳුන් තාක්ෂණයක් (සක පෝරුව භාවිතයෙන්) ද වී ගොවිතැන සහ අශ්වයන් ඇති කිරීම ද පමණක් නොව බ්‍රාහ්මී අක්ෂර භාවිතය ද පැවති බව පර්යේෂණ කැනීමෙන් ආචාර්ය සිරාන් දැරණියගල මහතා අනාවරණය කළේ ය ***(THE PRE HISTORY OF SRI LANKA - DR. SIRAN DERANIYAGALA - 1992 - Part -I, දැරණියගල අභිනන්දන-***

බුද්ධාගම රාජ්‍ය ආගම ලෙසින් ස්ථාපිත වූයේ දේවානම්පියතිස්ස රාජ යුගයේ බව වංසකතාවලින් ද ක්‍රි.පූ. 3 වන සියවසේ සිට ලියැවී ඇති පූර්ව බ්‍රාහ්මී අක්ෂර සහිත ලෙන් ලිපිවලින් ද පැහැදිලි වන කරුණකි. ***(INSCRIPTIONS OF CEYLON - Prof. senarat paranavitana - 1970, pp. CI- CV I)***

මේ ප්‍රවණතා අනුව අප රටේ බෞද්ධ සංස්කෘතිය ස්ථාපිත වීමෙහි ලා තව ද ඉතා වැදගත් අවස්ථාවක්, පූජනීය සිදු වීමක් මහින්දාගමනයේ අතුරු ප්‍රතිඵලයක් ලෙසින් උදා විය. දුමින්දාගමනය හෙවත් බුද්ධගයාවෙහි ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ශ්‍රී ලංකාවට වැඩම කරවීම ඉතා විශේෂිත වූ කරුණක් ලෙසින් වංසකතාවල සඳහන් වී ඇත. සම්බුද්ධ පරිනිර්වාණයට අවුරුදු දෙසිය තිස්හයකට පසු ව සිදු වූ මහින්දාගමනයත් ඉන් මාස හතරකට පමණ පසු සිදු වූ සංඝමිත්තාගමනය සහ ශ්‍රී මහා බෝධි ආගමනය යන කාරණා දෙක ලංකා ඉතිහාසයේ ඉතාමත් වැදගත් එමෙන් ම අනුස්මරණීය සිදු වීම් බවට විවාදයක් නැත. ඒ මඟින් ඇති වූ ප්‍රභාවට සම කළ හැකි වෙනත් ඓතිහාසික පුවතක් අපේ ඉතිහාස මඟෙහි අපට හමු නො වේ. එහෙත් මේ සිදුවීම් තුන එකක් හැටියට මිස වෙන වෙන ම ගෙන සාකච්ඡා කිරීම කළ හැකි හෝ කළ යුතු ද නො වේ. ඒවා සාකල්‍යයෙන් ම එකක් අනිකට සම්බන්ධ ය. දම්වැලක පුරුක් මෙන් ඒකාබද්ධ ය. ඒ සිද්ධි වර්ගීකරණයක් කළ යුතු නම් **මහින්දාගමනය ධර්මාවතරණයක් ලෙසිනුත් බෝධි ආගමනය සංස්කෘතිකාවතරණයක් ලෙසිනුත් හැඳින්වීම උචිත ය.** මිහිඳු මහරහතන් වහන්සේ සමඟ දහමත්, සංඝමිත්තා මෙහෙණින් වහන්සේ, බෝධි ශාඛාව වැඩම කරවීම සමග සංස්කෘතික හා ශිල්පීය කලා ශ්‍රේණී පැමිණීමත් සිදු වී ඇති හෙයිනි*(ශ්‍රී මහා බෝධීන්වහන්සේ - ඉතිහාසය තදනුබද්ධ සංස්කෘතිය - ආචාර්ය*

*වැලමිටියාවේ ධම්මරක්ඛිත ස්ථවිර - 1994 පි.88).*

අප රටේ ජනතාවගේ සිත් සතන්හි ජය ශ්‍රී මහාබෝධි ශාඛා රෝපණයේ බලපෑම් පිළිබඳ මෙසේ සඳහන් වේ. ''ඉන්දියාවේ බුද්ධගයාවේ සිට වැඩමවන ලද ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව රෝපණය ලාංකික ජන ජීවිතයෙහි අභ්‍යන්තරයට පිවිසීමෙන් සිදු වූ විපර්යාසයකි. එදා පටන් අද දක්වා ලක්වැසි බෞද්ධයෝ බුදුරජාණන් වහන්සේට සෙවණ දුන් බෝධි වෘක්ෂයේ මෙම ශාඛාවට අතිමහත් ගෞරවයක් දක්වති.'' පෝල්.ඊ. පීරිස් මහතා සඳහන් කරන පරිදි ජාතියේ සීඝ්‍ර ඉතිහාසයෙහි වෙනත් එකදු සිද්ධියක් හෝ මහා බෝධි වෘක්ෂ රෝපණය තරම් තදින් සිංහලයාගේ සිත් ගත්තේ ද යනු සැක සහිත ය. ''තනි ගල්තලයන් මතුයෙන් පෝෂණය ලබමින් ඉතා ශක්ති සම්පන්න ගොඩනැගිල්ලක් තුළට පවා පලාගෙන යන එකී මෘදු මුල් මෙන් මෙම වෘක්ෂයෙන් නිරූපණය වන බලය මිනිසුන්ගේ සිත් අභ්‍යන්තරයට විනිවිද ගොස් ඇත්තේ ය'' ***(P.E. PIERIS : CEYLON AND THE PORTUGUESE. P.3-4).***

අද මෙන් එදා ලෝකයේ ද කළගුණ සැලකීමෙන් බැහැර සමාජයක් බුදුරජාණන් වහන්සේගේ බුදු ඇසට දැකීමට ලැබෙන්නට ඇත. ඒ නිසා ම මීට වසර 2600කට ඉහත දී බුද්ධගයාවේ අස්වත්ථ වෘක්ෂය සෙවණේ දී බුද්ධත්වය ලැබීමෙන් පසු බුද්ධත්වය ලබා ගැනීමට සෙවණ දුන් ඒ වෘක්ෂරාජයාණන් වහන්සේට (ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ උද්භිද නාමය, ෆිකුස් රෙලිජෝසා - ***FICUS RELGIOSIA)*** කෘතගුණ සැළකීමේ දෙවන අවස්ථාව ලෙසින් සැළකිය හැකි අවස්ථාවක් මෙසේ බෞද්ධ සාහිත්‍යයෙහි සටහන් වී ඇත.

"මෙසේ ධර්මය දේශනා කිරීමට අදහස් කළ බුදුරජාණන් වහන්සේ ඊළඟට අදහස් කළේ ප්‍රථම ධර්ම දේශනය කළ යුත්තේ කා හට ද කවරෙක් වහා මේ ධර්මය වටහා ගැනීමට සමත් වෙයි ද යන කරුණු පිළිබඳව ය. එහි දී උන්වහන්සේට පළමුවෙන් ම සිහියට නැගුණේ ආලාරකාලාම යි. කිංසච්ච ගවේසී අවදියෙහි ඇසුර ලත් කාලාම ගැන උන්වහන්සේට මනා අද්දැකීමක් විය. ආකිඤ්චඤ්ඤායතන ධ්‍යානලාභියෙකු වූ හෙතෙම පණ්ඩිතයෙකි; ව්‍යක්තයෙකි; ප්‍රාඥයෙකි. බොහෝ කලක් මනස දියුණු කිරීමෙන් බෙහෙවින් කෙලෙස් නැති කරගත් කෙනෙකි. එබැවින් ඔහු වහා මේ ධර්මය අවබෝධ කොට ගැනීමට සමත් වෙතැයි සිතූහ. ඒ වන විට ආලාරකලාම මිය ගොස්

සතියක් ම ගත වී හමාර ය. මේ ධර්මය අසන්නට ඔහුට ලැබිණි නම් වහා අවබෝධ කර ගන්නවාට සැකයක් නැත. මේ අභාවයෙන් ඔහුට සිදු වූයේ මහත් අලාභයකැයි උන්වහන්සේට සිතිණ. ආකිඤ්චඤ්ඤායතනලාභී ව මිය යාමෙන් එම බ්‍රහ්ම තලයෙහි ඉපදීම හැර සම්බෝධියක් නිර්වාණයක් ලැබීමට හේතු නොවන බව දැන සිටියේ ඔහු වෙත තවුස්දම් පිරූ අවධියේ ම ය.

ඉන්පසු උන්වහන්සේ අදහස් කළේ උද්දකරාම පුත්ත තවුසාට දම් දෙසීමට ය. ඔහු පිළිබඳව ද උන්වහන්සේ වෙත පැවැත්තේ හොඳ අවබෝධයකි. කිංසච්ච ගවේසී අවදියෙහි බෝසතුන් කලක් ඔහු වෙත ද පුහුණුව ලද හෙයිනි. එදින ම මධ්‍යම රාත්‍රියෙහි ඔහු මියගොස් තිබුණි.

අනතුරුව භාග්‍යවතුන් වහන්සේ ස්වකීය ප්‍රථම ධර්ම දේශනාව පස්වග තාපසවරුන්ට දේශනා කිරීම මැනවැයි අදහස් කළහ. එයට හේතු වූයේ බෝසතුන් ප්‍රධන්වීර්යයෙහි යෙදී සිටි අවධියෙහි බෝසතුනට බෙහෙවින් ඇප උපස්ථාන කළ පිරිසක් වීමයි. තවුස් පැවිද්දට පත් මේ පිරිස කවදා හෝ සිද්ධාර්ථ ගෞතමයාණන් වහන්සේ සත්‍යාවබෝධය ලබා අපටත් දේශනා කරති යි යන සම්මුතියෙහි සිට උන්වහන්සේගේ අනුගාමිකයන් බවට පත්ව උන්වහන්සේට බෙහෙවින් උපකාරකව ක්‍රියා කරමින් සිටියහ. ප්‍රධන්වීර්යයෙහි නිරතවීමට බෙහෙවින් උපකාරක වූ මේ පංච වර්ගීය භික්ෂූහු මට උපස්ථාන කළහ. (-බහුකාරා ඛො මෙ පඤ්චවග්ගියා භික්ඛු යෙ මං පධාන පහිතත්තං උපට්ඨහිංසු යන පාඨයෙන් ඒ බව කියැවෙයි'') *(බුදුන් වදාළ බුද්ධ චරිතය - ආචාර්ය මහින්ද සංඝරක්ඛිත හිමි සහ කීර්ති නාරම්පනාව- 1999, පි. 96-98).*

රවීන්ද්‍රනාත් ඨාගෝර්තුමන්ගේ සඳහනකින් මේ සටහන නිමා කරමු.''ලෝකයේ පහළ වූ ශ්‍රේෂ්ඨතම මිනිසා වෙනුවෙන් මා හද පතුළෙන් ම තේරුම්ගත් පුද්ගලයා උපත ලද වෙසක් පුන් පොහොය දිනය නිමිත්තෙන් මාගේ ප්‍රණාමය පුද කරන්නට අද මම මෙහි පැමිණියෙමි. ඉහත කී දේවල් හැඳින්වීම විශේෂයෙන් කෙනෙකු හුවා දැක්වීමට අවස්ථාව අනුව පළ කළ ආටෝප සහිත හැඳින්වීමක් නොවේ. මේ පුද කරන්නේ මා තනි ව සිටිය දී බොහෝ වරක් උන්වහන්සේට පුද කළ ප්‍රණාමය ම ය. බුද්ධගයාවට ගිය විට මට සිතුණේ මෙබඳු දේ යඃ 'උන්වහන්සේගේ දෙපාවල ස්පර්ශයෙන් මේ ධරණිතලය අතීතයේ දී පවිත්‍ර බවට පත් විය. අහෝ උන්වහන්සේ ගයාවේ ජීවමාන ව සිටිද්දී

මට ඉපදීමට වාසනාවක් නොතිබුණේ ඇයි? ගතින් සිතින් ප්‍රත්‍යක්ෂ ලෙස උන්වහන්සේගේ පුණ්‍ය මහිමය විඳින්නට මට නොලැබුණේ ඇයි?' මහා පුරුෂයෝ මහා යුගයක ඉපදී අතීතයේ ද වර්තමානයේ ද දුර දක්වා විහිදුණු අනාගතයේ ද විරාජමාන වෙති. ඒ බව මට බුද්ධගයා සිද්ධස්ථානයේ දී තේරුම් ගියේ ය''***(-රවීන්ද්‍රනාත් ඨාගෝර්තුමා 1935 දී කල්කටාවේ මහාබෝධි මධ්‍යස්ථානයේ දී වෙසක් පුන් පොහෝ දා නිමිත්තෙන් කළ කථාවෙනි. ආචාර්ය සුධාංශුබිමල් බරුවා ලියූ රවීන්ද්‍රනාත් ඨාගෝර් සහ බෞද්ධ සංස්කෘතිය - පරිවර්තනය (2003) චින්තා ලක්ෂ්මි සිංහාරච්චි, පි. 202).***

2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය නිමිත්තෙන් පළ කෙරෙන ශ්‍රී ලංකා බෞද්ධ සංස්කෘතිය පිළිබඳ වන මේ ශාස්ත්‍රීය ලේඛන සංග්‍රහය වත්මන් මෙන් ම අනාගත පරපුර උදෙසා ද ප්‍රදානය කෙරෙන මහඟු සිහිවටනයක් වනු ඇතැයි අපි විශ්වාස කරන්නෙමු.

මනුෂ්‍යයා හා මනුෂ්‍යත්වය සඳහා වූ මේ මහා ලෝක අනුකම්පාව පදනම් කරගෙන උතුරු ඉන්දියාවේ කුශාණ රාජවංශිකයන් (ක්‍රි.ව.70-480) සහ ගුප්ත රාජ වංශිකයන් (ක්‍රි.ව. 320-650) යටතේ නව සම්ප්‍රදායයක උපත සිදු විය. ඒ සම්ප්‍රදායය සියල්ලන්ගේ ම ගැලවීම අරමුණු කරගත් දියුණුවට පත් භක්ති මාර්ගය යි. ශ්‍රී ලංකාව, බුරුමය (මියන්මාර්) හා තායිලන්තය ඇතුළු රටවල් රැසක් මුලින් සඳහන් කළ ථෙරවාදි සම්ප්‍රදායයන් ද පසුව සඳහන් කළ සම්ප්‍රදාය මහායානය වශයෙන් නේපාලය, තිබ්බතය, ජපානය, චීනය හා කොරියාව යන රටවල පැතිරුණි.

මේ තත්ත්වය මෙසේ වුව ද බුද්ධාගමෙහි සියලු ම නිකාය සම්ප්‍රදායයන් විසින් ම බෞද්ධ දර්ශනයේ නිර්මාතෘවරයාණන් වහන්සේ ගෞතම බුදුරජාණන් වහන්සේ ලෙසින් ම පිළිගනු ලැබේ. එපමණක් ද නොව සිදුහත් කුමරු ශ්‍රී මහා බෝධීන් වහන්සේ සෙවණෙහි සම්මා සම්බුද්ධත්වය නම් වූ උත්තරීතර ඥානය ලබා ගත් බව ද දුකින් මිදීමේ විමුක්ති මාර්ගය සකළ සත්වයාට ම නිවන් මඟ හෙළි කළ මහා උත්තමයාණන් වහන්සේ බව ද පිළිගනී. සමස්තයක් ලෙසින් සලකන කල්හි ජම්බුද්වීපයේ (ඉන්දියාවේ) සිට ලෝකයේ විවිධ ප්‍රදේශවලට හා රටවලට බුදු සමය පැතිර යාමේ දී බාහිර දර්ශනයෙන් සේ ම අදහස් අනුව ද විවිධ වූ ස්වරූප ගත්තේ වී නමුදු මූලික පදනම වූයේ එක ම ය'' ***( 2600 YEARS OF BUDDHISM- GENERAL EDITOR. Prof. P.V. BAPAT'***

*(1956) P.III THE PUBLICATION DIVISION OF INFORMATION AND BROAD-CASTING. GOVT. OF INDIA ).*

2600 ශ්‍රී සම්බුද්ධත්ව ජයන්තිය වර්ෂය 2011 වෙසක් මස පුර පසොළොස්වක දිනයේ සිට 2012 වෙසක් මස පුර පසොළොස්වක දා තෙක් පැවැත්වේ. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනය ධම්මචක්කපවත්තන සූත්‍රය පස්වග මහණුන් වහන්සේලාට දේශනා කළේ ඉසිපතනාරාම (සාරානාත්) පුදබිමේ දී ය. ඇසළ පුර පසළොස්වක දිනට දම්සක් පැවතුම් සූත්‍රයට ද 2600 වර්ෂය සපිරුණි. ඉන්දියාවේ උත්තර ප්‍රදේශයෙහි වාරාණාසි දිස්ත්‍රික්කයේ පිහිටි පුරාණ ඉසිපතන මිගදාය බෞද්ධ සාහිත්‍යයෙහි දැක්වෙන පරිදි කාශ්‍යප බුදුරජාණන් වහන්සේ උපන් ස්ථානය ලෙසින් ද සඳහන් වේ.

බෝමැඩ සත් සතියක් ගත කිරීමෙන් පසු ව බුදුරජාණන් වහන්සේ බුද්ධගයාවේ සිට කි.මී. 250 පමණ දුරින් පිහිටි ඉසිපතනාරාමය (මෙකල වාරාණාසි අසල සාරානාත්) බලා වැඩම කළහ. ඉන්දියාවේ උත්තර ප්‍රදේශයෙහි පිහිටි මේ පුදබිම නූතන යුගයේ අනගාරික ධර්මපාලතුමාගේ උත්සාහය නිසා බෞද්ධයන්ට වැඳපුදා ගැනීමට අවස්ථාව සැලසී ඇත. ඉන්දියානු රජයේ අනුග්‍රහය ද එකල අනගාරික ධර්මපාලතුමා විසින් ලබා ගන්නා ලදී. අනගාරික ධර්මපාලතුමාගේ එම සේවා ඇගයීම පිණිස සාරානාත්හි ප්‍රධාන මාර්ගය"අනගාරික ධර්මපාල මාවත" නමින් ඉන්දියානු රජය විසින් නම් කර ඇත.
*(දඹදිව සිව්මහ පුදබිම් - 2011- සිරිසමන් විජේතුංග - පි.55)*



# අන්තර්ගතය

## පළමුවන කාණ්ඩය

## බුදුසමයේ ඉතිහාසය


පිටු අංකය

01. සිද්ධාර්ථ ගෞතම තථාගතයාණෝ 29
- මහාචාර්ය බෙල්ලන්විල විමලරතන නාහිමි

02. දම්සක් පැවතුම් සූත්‍රය : බුදු සමයේ උපත 39
- එඩ්වින් ආරියදාස

03. මහින්දාගමනයට පෙර ශ්‍රී ලංකාවේ පැවති බුද්ධාගම 47
- වි.වා.මු. තිලකසිරි බණ්ඩාර

04. ශ්‍රී මහාබෝධීන් වහන්සේ සහ බෝධි සංස්කෘතිය 57
- ආචාර්ය අලුත්වැව සෝරත නාහිමි

05. ශ්‍රී දළදා වහන්සේ සහ පුදපූජා 68
- මහාචාර්ය කුඹුරුගමුවේ වජිර නාහිමි

06. ආගමක් සේ ස්ථාපිත වූ බෞද්ධ දර්ශනය 81
- මහාචාර්ය විනී විතාරණ

07. අනුරාධපුර ප්‍රත්‍යන්ත කලාපය මධ්‍යගත විහාරාරාම සම්ප්‍රදයය හා එහි අවකාශය 94
- මහාචාර්ය ප්‍රිශාන්ත ගුණවර්ධන

දෙවන කාණ්ඩය

<u>*සාහිත්‍යය*</u>

08. ශිලා ලේඛනවලින් හෙළිවන ආගමික, ආර්ථික හා දේශපාලන සංස්කෘතිය 111
- මහාචාර්ය සිරිමල් රණවැල්ල

09. හෙළටුවා සාහිත්‍යය 144
- පණ්ඩිත සිරි තිලකසිරි

10. අටුවා ගැටපද සන්න සාහිත්‍යය 162
- මහාචාර්ය විමල් ජී. බලගල්ලේ

11. බුද්ධධර්මය ආශ්‍රයෙන් නිර්මාණය වූ සිංහල ගද්‍ය පද්‍ය සාහිත්‍යය 188
- ආචාර්ය ප්‍රේමදාස ශ්‍රී අලවත්තගේ

12. බුද්ධඝෝෂ ආචාර්යයන් වහන්සේ හා අටුවාකරණය 211
- ආචාර්ය මැදගොඩ අභයතිස්ස හිමි

13. පුරාණ ලේඛනකරණයේ උදාව සහ පුස්කොළ පොත් භාවිතය 222
- විමල් රූබසිංහ

## තුන්වන කාණ්ඩය
## භික්ෂු සමාජය

14. මහාවිහාරය 233

- මහාචාර්ය විනී විතාරණ

15. අභයගිරිය, ජේතවනය සහ ලක්දිව මහායාන බුදුසමය 238

-මහාචාර්ය චන්ද්‍රිම විජේබණ්ඩාර

16. සිඛවළඳ කෘතියෙන් හෙළි වන පැරැණි ශ්‍රී ලංකාවේ භික්ෂු ජීවිතය 252

- මහාචාර්ය කිවුලේගෙදර නාරද හිමි

17. චීන භික්ෂූන් වහන්සේලාගේ දේශාටන වාර්තාවලින් හෙළි වන අනුරාධපුර යුගයේ ශ්‍රී ලංකාවේ බෞද්ධ සමාජය 259

- ආචාර්ය හව් වේමින්

18. ශ්‍රී ලංකාවේ සංඝ සමාජය සහ සිංහල කතිකාවත් 280

- මහාචාර්ය ඒ. වී. සුරවීර

19. පිරිවෙන් ශාස්ත්‍රෝන්නතිය 296

- පියසිරි නාගහවත්ත

## හතරවන කාණ්ඩය
## කලාශිල්ප

20. බෞද්ධ සංස්කෘතිය මධ්‍ය ආසියාවේ පැතිරීම සඳහා කණිෂ්ක රජුගේ දායකත්වය 307

- ගුණතිලක බණ්ඩාර

21. ශ්‍රී ලංකාවේ මූර්ති ශිල්පය සඳහා
අමරාවතී බෞද්ධ කලාවේ බලපෑම 314
- සිරිසමන් විජේතුංග

22. පුරාණ දෘශ්‍ය කලාවේ බෞද්ධ සන්නිවේදනය 323
- මහාචාර්ය උදා හෙට්ටිගේ

23. බෞද්ධ සාහිත්‍යය සහ ශිලාලේඛනවලින්
හෙළි වන පුරාවිද්‍යා උරුම කළමනාකරණය 338
- චිත්‍රා දඹදෙණිආරච්චි

පස්වන කාණ්ඩය

<u>ජන කලාව</u>

24. ශ්‍රී පාදස්ථානය හා පුදපූජා 351
- ආචාර්ය ඊ. ඇම්. රත්නපාල

25. පන්සියපනස් ජාතක පොත සහ
සිංහල ජන සංස්කෘතිය 366
- මහාචාර්ය බී. ඒ. ටෙනිසන් පෙරේරා

26. සිංහල ජනකාව්‍ය නිර්මාණ කෙරෙහි බලපෑ
ආගමික පසුබිම 374
- මහාචාර්ය හර්සන් ඩයස්

27. තුනුරුවන් ගුණ වර්ණනා කෙරෙන දේශීය
ශාන්තිකර්ම සාහිත්‍යය 391
- මහාචාර්ය ලයනල් බෙන්තරගේ

28. සිංහල සංගීත කලාව උදෙසා බෞද්ධ
සංස්කෘතියේ බලපෑම 423
- ආචාර්ය දයාරත්න රණතුංග

29. නාඩගම් හා නූර්ති ගීතවල බෞද්ධ ස්වරූපය 432
- විශාරද ජයන්ත අරවින්ද

හයවන කාණ්ඩය

## පුනර්ජීවනය


30. දේශීය ආගම හා සංස්කෘතිය කෙරෙහි විදේශ ආක්‍රමණවල බලපෑම 443
- ඒ.එම්. කරුණාරත්න

31. ලක් බුදුසසුන සියම් දේශයට වැඩමකර වීම 460
- මහාචාර්ය මැන්දිස් රෝහණදීර

32. සිරි සරණංකර සඟරජ මාහිමි ඇති කළ ශාසනික ප්‍රබෝධය 479
- ආචාර්ය අබේරත්න අදිකාරි

33. වර්තමාන වෙසක් ප්‍රබෝධයේ ආරම්භය 499
- මහාචාර්ය කේ. එන්. ඕ. ධර්මදාස

34. පංච මහාවාදය සහ බෞද්ධ පුනරුදය 509
- මහාචාර්ය රත්න විජේතුංග

35. විසිවැනි සියවසේ බෞද්ධ පුනර්ජීවනයේ පුරෝගාමී මහා පුරුෂයා - අනගාරික ධර්මපාල තුමා 518
- අමර හේවාමද්දුම

36. සෙන්පති ඕල්කට්තුමන් විසින් සිදු කරන ලද දේශීය බෞද්ධ අධ්‍යාපන මෙහෙවර 526
- ස.මු. ජයතිලක

36. සිරි සම්බුදු සරණ 540
- විජිත් කණුගල

37. අතීතාවලෝකනය - පසු වදන 542

# පුරාණ දෘශ්‍ය කලාවේ බෞද්ධ සන්නිවේදනය

- මහාචාර්ය උදා හෙට්ටිගේ

## හැඳින්වීම

ශ්‍රී ලාංකික සිතුවම් කලාවේ ඓතිහාසිකත්වය ජගත් ශිෂ්ටාචාරයන්හි දක්නට ලැබෙන ආකාරයෙන් ම ප්‍රාග් ඓතිහාසික ගෝත්‍රික ශිෂ්ටාචාරයන්ගේ සභ්‍යත්වයන්ට උරුමකම් කියන බව නොරහසකි. එහෙත් ශ්‍රී ලංකා චිත්‍ර කලා ඉතිහාසය තුළ ක්‍රි. ව. 17 වන සියවසෙන් පසු නිර්මාණය වන විහාර චිත්‍රකරණයෙහි සත්‍ය වශයෙන් ම වෙන්කොට හඳුනාගත හැකි පරිදි විෂයපථයෙහි ක්‍රමානුකූල බවක් දක්නට ලැබේ. ලෞකිකත්වයෙන් මිදුණු පාරභෞතික ධාරක ක්ෂේත්‍රයක් නිර්මාණය වීමේ ස්ථිරසාර ක්‍රමවේදයක් පැවති බව වර්තමාන ශේෂිතයන් ගෙන් පවා සනාථ වන හෙයිනි. බෞද්ධාගමික පසුබිමක් පෙරදැරි කරගෙන නිර්මාණය වූ චිත්‍ර ලාංකේය ශිෂ්ටාචාරයේ අනුරාධපුර අවධිය කරාම දිවයන බව පෙනේ. විශේෂයෙන් ම ලෙන් හෝ ධාතුගර්භ ආදිය පදනම් කර ගනිමින් සිතුවම් නිර්මාණය වීමේ සිරිත පැවති බවට සාධක තිබේ.

ඓතිහාසික වශයෙන් අප හඳුනාගන්නා වූ පොළොන්නරුව වැනි ප්‍රධාන රාජධානි සමයන්හි දී පවා බෞද්ධාගමික අන්තර්ගතයෙන් පෝෂණය වූ දෘෂ්‍ය කලා නිර්මාණ බිහි වූ බවට සාධක සපයා ගැනීම දුෂ්කර නො වේ. මෙහි දී මා මෙම ලිපිය විහාර සිතුවම් කලාවට පමණක් සීමා කිරීමට අදහස් කරනුයේ ඒ තුළ දක්නට ලැබෙන්නා වූ ද, ඒවාට ම ආවේණික වූ ද සුවිශේෂී ක්‍රමවේද තීව්‍ර කොට දැක්වීම උදෙසා ය. එසේ වුවද මෙහි දී විශේෂ අවධානයට යොමු වනුයේ විහාර සිතුවම් කලාව පිළිබඳව වන හෙයින් මහනුවර රාජධානි සමයේ